# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1787/38 – 2012 දෙසැම්බර් 07 වැනි සිකුරාදා – 2012.12.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 306 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2011/UDA/201.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 115/13/01/21.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 04 වැනි දින,
'මිහිකත මැදුර',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මාවනැල්ල.

2. **ඉඩමේ විස්තරය.**– සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොට්ඨාස අංක 3) රන්කොන්දිවල ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක KE/MWN/2011/152 හා 2012.05.28 දිනැති පුගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර "A" සහ "B" වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 3.7181 ක් පමණ වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර "A" – රුක්අත්තනේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.2137**
උතුරට: කැබලි අක්ෂර B; නැගෙනහිරට: ඇළ; දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර B.

02. **කැබලි අක්ෂර "B" – රුක්අත්තනේ කුඹුර, මීගස් කුඹුර, වත්තගේ කුඹුර, පල්කඩ කුඹුර, දෙබටාව කොහොලන්පැල, මුවන් කුඹුර, මලදූල්ල කුඹුර – ප්‍රමාණය: හෙක්. 3.5044**
උතුරට: ඇළ, දේවාලේ කුඹුරේ ඉන් නියර, පාලුවත්ත, ඇළ සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: ඇළ සහ වලව්වේ වත්ත; දකුණට: ඇළ, වලව්වේ වත්ත සහ මාර්ග (මා.සං.අ.); බටහිරට: මාර්ග (මා.සං.අ.) සහ ඇළ (වියලි).

12 - 616